**පලාගල ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පලාගල ප්‍රාදේශීය සභාවෙ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය/ ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට පලාගල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වු ශ්‍රී ලංකා රාජ්‍ය අංශ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතියෙහි අංක 5.2 ඡේදයට පටහැනිව සභාවේ අවන්හලේ 2022 දෙසැම්බර් 31 දිනට වූ තොගය විකුණුම් මිලට රු.125,742 ක් ලෙස අගය කර තිබුණි. | පිළිගන්නා බව. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන නොවන වියදම් සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබුණු රු.244,293 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදි කර ඇති බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ පරිසර බලපත්‍ර ගාස්තු ආදායම රු.5,175 ක් අඩුවෙන්ද පරිසර බලපත්‍ර පරීක්ෂණ ගාස්තු ආදායම රු.5,175 ක් වැඩියෙන්ද විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දක්වා තිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ කුලී ආදායම් රු.127,137 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | සභාවේ එකතු කිරීම් අනුව වෙනසක් නොමැති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 වර්ෂයේ සිට පැවත එන රු.66,800 ක හිඟ කඩ කුලී ආදායම් සමාලෝචිත වර්ෂයේ වත්කම් හා වගකීම් ප්‍රකාශයෙහි හුවමාරු ගනුදෙනුවලින් ලැබිය යුතු දෑ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ බොරළු මාර්ග අළුත්වැඩියා වියදම රු.258,485 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී රු.110,245 ක පුස්තකාල පොත් මිලදී ගැනීම විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි සුභසාධන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | -එම- | පුස්තකාල පොත් ජංගම වත්කම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |
| (උ) | ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලි ආදායම් රු.22,329 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | නිවැරදි ආදායම් ශීර්ෂය යටතේ ගිණුම්ගත කළ යුතුය. |
| (ඌ) | 2021 වර්ෂයේදී ගොඩනැගිලි රු.3,961,169 ක් සහ මාර්ග රු.568,140 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම සමාලෝචිත වර්ෂයේද නිවැරදි කර නොතිබුණි. මේ නිසා 2020 හා 2021 වර්ෂයේ ක්ෂය කිරීම් හා ක්ෂය වෙන්කිරීම් රු.155,843 ක් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි. | -එම- | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි දේපල පිරියත උපකරණ මිලදී ගැනීම් මුදල් ප්‍රවාහය තුල රු.6,465,293 ක ණයහිමි ශේෂයක්ද ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන මුදල් ප්‍රවාහය තුළ රු.6,465,293 ක ණයගැති ශේෂයක්ද වර්ෂය තුල ලැබීම් හා ගෙවීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | උපචිත පදනම මත ගිණුම්ගත කිරීම නිසා වෙනසක් පෙන්වන නමුත් ගිණුම්ගත කිරීම නිවැරදි බව. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මුදල් ගලා ඒම් සහ ගලායාම් පමණක් සඳහන් කළ යුතුය. |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේදී ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන වටිනාකම රු.70,652 ක් වැඩියෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | කොන්ක්‍රීට් ව්‍යාපෘතියෙන් සමාලෝචිත වර්ෂයේදී සුභසාධන පදනම මත රු.109,425 ක නිෂ්පාදනයක් ලබාදී තිබුණු නමුත් එය අත්හැර ලාභ අලාභ ගණනය කර තිබුණි. | -එම- | -එම- |
| (ඕ) | සභාව විසින් වෙනත් පාර්ශවයන්ට එරෙහිව නඩු පැවරීම් කර තිබුණු නමුත් ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරවු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | හෙළිදරව් කළ යුතුය. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගිණුම් විෂයයන් 04 ක මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් සහ උපලේඛනවල සඳහන් වටිනාකම අතර රු.1,316,186 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා සමඟ සැසඳීම කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වත්කම් හා වගකීම් ප්‍රකාශය අනුව ශුද්ධ වත්කම්/ස්කන්ධය රු.317,456,134 ක් ලෙස හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි එය රු.310,781,899 ලෙස දක්වා තිබීම නිසා රු.6,674,235 ක වෙනසක් විය. | -එම- | -එම- |

**1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.7,650,312 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් සනාථකර ගැනීම සඳහා ප්‍රමාණවත් හා යෝග්‍ය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | සාක්ෂි ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. | තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2009 ජුලි 17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 09/2009(i) | නිලධාරීන් සහ සේවකයින්ගේ පැමිණීම සහ පිටවූ වේලාවන් සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | 2023 පෙබරවාරි මාසයේ සිට ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිත කරන බව. | චක්‍රලේඛයේ ප්‍රකාරව ක්‍රියා කළ යුතුය. |
| (ආ) | 2015 මාර්තු 31 දිනැති 02/2015 රාජ්‍ය මුදල් විධිවිධාන චක්‍රලේඛයේ 7 වන ඡේදය | සභාව සතු අක්‍රීය තත්ත්වයේ පවතින වාහන 11 ක් අළුත්වැඩියා කිරීම හෝ එසේ කළ නොහැකි නම් අපහරණය කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | අපහරණය කිරීමට කටයුතු කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ වියදම රු.6,674,235 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ වියදම රු.10,159,871 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,559,450 | 1,632,460 | 1,648,660 | - | 1,474,650 | 1,620,625 | 1,604,425 | 16,200 |
| (ii) | කුලී | 2,064,960 | 2,137,903 | 2,257,953 | 1,390,800 | 1,145,000 | 2,083,450 | 680,800 | 1,510,850 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 306,995 | 267,175 | 268,175 | - | 264,000 | 281,100 | 280,100 | 1,000 |
| (iv) | වෙනත් ආදායම් | 34,132,300 | 13,605,759 | 10,308,586 | 8,136,239 | 37,330,800 | 27,224,902 | 34,219,487 | 4,839,066 |
| | | 38,063,705 | 17,643,297 | 14,483,374 | 9,527,039 | 40,214,450 | 31,210,077 | 36,784,812 | 6,367,116 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(i) වගන්තිය ප්‍රකාරව සභා බලප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශයක් ලෙස පුබ්බෝගම නගරය තෝරාගෙන ඇතත් ඒ පිළිබඳ ගැසට්කර වරිපනම් අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වරිපනම් අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කළ යුතුය. |
| **(ආ) කුලී** | | |
| (i) මෝටර්ග්‍රේඩරය සහ පස්තලනය කුලියටදීම වෙනුවෙන් වසර 01 ත් 05 ත් අතර කාලයක | -එම- | හිඟ ආදායම් අයකරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සිට ලැබිය යුතු හිඟ ආදායම් රු.1,902,300 ක් විය. මෙම හිඟ ආදායමෙන් වැඩි ප්‍රමාණයක් ප්‍රාදේශීය සභා සභාපති හා සභිකයන්ගෙන් ලැබිය යුතුව තිබුණි. | | |
| (ii) | සමාලෝචිත වර්ෂයේදී දෙසැම්බර් 31 දිනට වසර 1 – 2 අතර කාලයක සිට අයනොවී පවතින කඩකුලී රු.161,750 ක්ද වසර 1 – 10 අතර කාලය සිට අයනොවී පවතින මස් කඩ ටෙන්ඩර් ආදායම් රු.1,295,850 ක්ද විය. | -එම- | -එම- |
| **(ඇ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | බල ප්‍රදේශයේ පිහිටි දැන්වීම් පුවරු සහ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳව විධිමත් පරිදි සමීක්ෂණයක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර ලේඛණගත කර නොතිබුණි. | -එම- | සමීක්ෂණයක් සිදුකළ යුතුය. |
| **(ඇ)** | **වෙනත් ආදායම්** | | |
| (i) | කොන්ක්‍රීට් නිෂ්පාදන ව්‍යාපෘතිය මගින් නිපදවන ලද බ්ලොක් ගල් සහ කොන්ක්‍රීට් වළලු වෙනුවෙන් ලැබිය යුතු රු.210,698 ක් අයවී නොතිබුණි. | -එම- | හිඟ ආදායම් අයකරගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට වසර 1 – 2 අතර කාලයක සිට අයනොවී පවතින රු.954,288 ක් වූ ලැබිය යුතු ශේෂ 03 ක් විය. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1.1 සෝ ගාතකාගාර පහසුකම් ලබානොදී මස් අලෙවිසැල් පවත්වාගෙන යාමට ඉඩදීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගව ගාතකාගාරයක් ඉදිකිරීම සඳහා සභාව වෙත ඉඩමක් වෙන්කර තිබුණු නමුත් ගව ගාතකාගාර ඉදිකිරීමට කටයුතු නොකර නෙල්ලියගම, බළලුවැව සහ පුබ්බෝගම යන ස්ථානවල ගවමස්හල් පවත්වාගෙන ගොස් තිබුණි. | අදහස් දක්වා නොමැත. | ගව ඝාතකාගාර ඉදිකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) 1988 අගෝස්තු 23 දිනැති පොදු සම්මත අතුරු ව්‍යවස්ථා ගැසට් නිවේදනයේ 32 අතුරු ව්‍යවස්ථාව 09 වගන්තිය ප්‍රකාරව අලෙවි කිරීමට සුදුසු බවට සභාවේ මුද්‍රාව යොදා මස් පරීක්ෂා කිරීම වෙනුවෙන් කිලෝ එකක් සඳහා රු.10 ට නොඅඩු මුදලක් සභාව වෙත ලබාගෙන නොතිබුණු අතර මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පරීක්ෂා කරන ලද මස් සහ සතුන් පිළිබඳ විස්තරද ලබාගෙන නොතිබුණි. | -එම- | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වර්ෂයේදී ක්‍රියාත්මක වූ ජනතාව වෙත භාණ්ඩ බෙදාදීමේ වැඩ සටහන වෙනුවෙන් සභාවට අය විය යුතු රු.450,044 ක් අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ විෂය ලිපිකරුගේ ප්‍රකාශය අනුව 2022 වර්ෂයේදී බොරළු කියුබ් 335 ක් සඳහා රු.3,182,000 ක් ගෙවූ බවට සඳහන් කර තිබෙන නමුත් ගෙවීම් වවුචර්වලට අනුව බොරළු කියුබ් 501 ක් සඳහා රු.3,507,000 ක් ගෙවා තිබුණි. | පිළිගන්නා බව. | අනුරූපී වාර්තා සමඟ සැසඳීම කළ යුතුය. |

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රාදේශීය සභාවේ තනතුරු 06 කට අදාළව සේවක පුරප්පාඩු 07 ක් ද එක් තනතුරකට අදාළව සේවක අතිරික්තයක්ද පැවතුණි. | අදහස් දක්වා නොමැත. | පුරප්පාඩු පිරවීමටත් අතිරික්ත සේවකයින් වෙනත් ආයතනයකට මුදාහැරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) සේවක ණය ගිණුමට අදාළව සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.96,456 ක් අයකරගෙන නොතිබුණි | -එම- | අය කර ගත යුතුය. |

### 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉන්ටර්ලොක් ගල් නිපදවා අලෙවි කිරීමේ ව්‍යාපෘතියක් සඳහා සමාලෝචිත වර්ෂයේදී යන්ත්‍ර මිලදී ගැනීමට සහ ගොඩනැගිලි සකස් කිරීම සඳහා රු.8,829,079 ක් ගෙවා තිබුණු නමුත් ඉන්ටර්ලොක් ගල් නිපදවීමේ කටයුතු ආරම්භ කර නොතිබීම නිසා එම වත්කම් නිශ්කාර්යව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් නිෂ්ක්‍රියව නොතබා ආදායම් ඉපයීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී හිඟුරුවැව ප්‍රදේශයේ රු.19,741,026 ක් වැය කර ඉදිකරන ලද බහුකාර්ය ගොඩනැගිල්ල සහ ලිඳ නිශ්කාර්යව පැවතුණි. | -එම- | මෙම වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | සභා බලප්‍රදේශයේ පිහිටි ස්වභාවික ජල උල්පතක් මගින් ලබාගන්නා ජලය බෝතල් කර අලෙවි කිරීම 2022 වර්ෂයේ ජුලි මාසයේදී සිට ආරම්භ කර තිබුණි උල්පත් ජලය පානීය ජල බෝතල් කිරීම සඳහා සුදුසු නොවන බවත් ජල මූලාශ්‍රයක් තිබිය යුතු බවටත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් දන්වා සිටීම නිසා එම ජල බෝතල් අලෙවි කිරීමේ ව්‍යාපෘතිය නතරවී ඇත. එම නිසා මෙම ව්‍යාපෘතිය සඳහා මිලදීගත් වටිනාකම රු.990,785 ක් වූ හිස් ප්ලාස්ටික් බෝතල් 25978 ක සහ වටිනාකම රු.88,233 ක් වූ ඇසුරුම් ද්‍රව්‍යද 2022 දෙසැම්බර් 31 දින වනවිට ඉතිරිවී තිබුණි. | -එම- | ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබිය යුතුවේ. තිබෙන ජල බෝතල් අලෙවි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.6 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් තණකොළ කපන යන්ත්‍රයක අළුත්වැඩියා පමණක් සිදු කිරීමට තිබියදී ට්‍රැක්ටරයද සමඟ ලබාදී තිබීම නිසා එය 2022 ඔක්තෝබර් 12 දින සිට පෞද්ගලික ගරාජයක ගාල්කර තිබුණු අතර කුඩා ප්‍රමාණයේ පස්තලන යන්ත්‍රයක්ද 2021 වර්ෂයේ සිට ගලේවෙල පෞද්ගලික ආයතනයක ගාල්කර තිබුණි. මෙම යන්ත්‍ර අළුත්වැඩියාකර සභාවට රැගෙන ඒමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මෙම වාහන අළුත්වැඩියාව නිමකර සභාව වෙත රැගෙන ඒමට කටයුතු කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී වැඩ හා සේවා සඳහා මිලගණන් කැඳවීමක් සිදුනොකර රු.1,370,410 ක සෘජු මිලදී ගැනීම් සිදු කර තිබුණි. | අදහස් දක්වා නොමැත. | මිල ගණන් ලබා ගැනීමට ක්‍රියා කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ බැහැර කිරීම සඳහා සභාව විසින් නිශ්චිත ස්ථානයක් තෝරාගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදීද බලප්‍රදේශයේ කසළ එකතු කිරීමෙන් සභාව වැලකී කටයුතු කර තිබුණි. | කසළ ලබාගැනීම නවතා ඇති අතර අදාළ පුද්ගලයන් මගින් කසළ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට උපදෙස් ලබාදී ඇති බව. | විධිමත් කසළ කළමනාකරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතුය. |